# කලාපීය / ප්‍රාදේශීය සංචාරක පුහුණු වැඩසටහන - 2022

## සංවිධානය - රුහුණු සංචාරක කාර්යාංශය

# දකුණු පළාත් සභාව

ඉහත වැඩසටහන සඳහා පහත සඳහන් අවම සුදුසුකම් ඇති **දකුණු පළාත තුළ ස්ථිර පදිංචි** අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අවම සුදුසුකම්**

1. දෙවරකට නොඅඩු වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විෂයන් 04 කින් සමත් වීම හෝ සංචාරක ක්ෂේත්‍රයේ වසර දෙකකට නොඅඩු කාලයක පළපුරුද්ද / විදේශ භාෂාවන් දන්නා අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අයෙකු විය යුතුය.
3. ඉල්ලුම්කරුවන් මනා කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

දැනට රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු සහ විශ්‍රාමික අයට ද මේ සඳහා අයදුම් කළ හැක. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සති තුනක කාලයක් සහ අධ්‍යාපන චාරිකාවකින් සමන්විත මෙම පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තු ලෙස රුපියල් 18,000.00 ක් අය කරනු ලැබේ.

මෙම පාඨමාලාව සාර්ථකව හදාරන අයවලුන් සඳහා දකුණු පළාත ආවරණය වන පරිදි කලාපීය සංචාරක මාර්ගෝපදේශක බලපත්‍රය ලබා දෙනු ලැබේ. මේ පිළිබඳ විස්තර සහ අයදුම්පත්‍ර රුහුණු සංචාරක කාර්යාංශය, 153 "බී", එස්.එච්. දහනායක මාවත, ගාල්ල යන ස්ථානයෙන් හෝ www.southernsrilanka.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක. තැපැලෙන් ලබා ගන්නේනම් නම සහ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ ලියුම් කවරයක් එවන මෙන් දන්වන අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2022-03-31 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවන මෙන් දන්වමි.

ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **කලාපීය / ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශන පුහුණු වැඩසටහන** - 2022 ලෙස සඳහන් කළ යුතුය.

**කළමනාකාර අධ්‍යක්ෂ,**
**රුහුණු සංචාරක කාර්යාංශය,**
**153 බී, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.**